# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

**Economics**

නිපුණතාවය 06

සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය විග්‍රහ කරයි

---

# සාර්ව ආර්ථික සමතුලිතය


**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය :**R H M S **කුමුදුනී රාජකරුණා**

**ර / විද්‍යාලෝක ම. ම. වි**


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

# අන්තර්ගතය

- **සාර්ව ආර්ථික සමතුලිතය**

  -සමාහාර ආදායම = සමාහාර වියදම

  -කාන්දුවීම් = විදීම්

  -සමාහාර ඉල්ලුම් = සමාහාර සැපයුම්

- **ගුණක ක්‍රියාවලිය**

  -පරිභෝජන වියදම් ගුණකය

  -ආයෝජන වියදම් ගුණකය

  -රජයේ වියදම් ගුණකය

  - බදු ගුණකය

  -සංක්‍රාම ගුණකය

  -තුලිත අයවැය ගුණකය

- **පූර්ණ සේවා නියුක්ති නිමැවුම්**

  -උද්ධමනාත්මක පරතරය

  -ප්‍රතිගමනාත්මක (අවධමනාත්මක) පරතරය

## පාඩමට පිවිසීම

අනුරාධපුර නගරයේ පරාට ව්‍යාපාරයේ නිරත A ,B හා C යන පුද්ගලයන් තිදෙනාගේ ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ ඔබ කණ්ඩායමට ලැබෙන කඩහිමියාගේ ආදායම හා වියදම පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

A කඩහිමියාට

| | | |
|---|---|---|
| පිටි | 5kg | 500. 00 |
| දෛනික ගෑස් | | 300.00 |
| කොත්තු බාස් | | 1800.00 |
| ඊස්ට් | | 120.00 |
| වෙනත් | | 880.00 |

මොහු දිනකට රු 12. 00 බැගින් පරාට 300 ක් අලවි කරයි

B කඩහිමියාට

| | | |
|---|---|---|
| පිටි | 6kg | 600 00 |
| දෛනික ගෑස් | | 400.00 |
| කොත්තු බාස් | | 2000.00 |
| ඊස්ට් | | 150.00 |
| වෙනත් | | 850.00 |

මොහු දිනකට රු 15. 00 බැගින් පරාට 400 ක් අලවි කරයි

C කඩහිමියාට

| | | |
|---|---|---|
| පිටි | 4kg | 400 00 |
| දෛනික ගෑස් | | 240.00 |
| කොත්තු බාස් | | 1800.00 |
| ඊස්ට් | | 60.00 |
| වෙනත් | | 500.00 |

මොහු දිනකට රු 10. 00 බැගින් පරාට 250 ක් අලවි කරයි

## 1 සාර්ව ආර්ථික සමතුලිතය

සාර්ව ආර්ථික සමතුලිතය යනු සමස්ත නිමැවුමේ වටිනාකමට සමාන සමස්ත ඉල්ලුමක් පවතින අවස්ථාවයි. මෙහි දී සමස්ත ඉල්ලුම සපුරාලීමට සමත් සමස්ත සැපයුමක් පවතී.

සාර්ව ආර්ථික සමතුලිතය ඉදිරිපත් කළ හැකි ප්‍රවේශ පහත සඳහන් වේ.

1. සමාහාර ආදයම් = සමාහාර වියදම් ප්‍රවේශය (Y=E)
2. කාන්දු වීම් = විදීම් ප්‍රවේශය (Y=E)
3. සමාහාර ඉල්ලුම් = සමාහාර සැපයුම් ප්‍රවේශය (AD=AS)

සමස්ත ඉල්ලුම සපුරාලීමට සමත් සමස්ත සැපයුමක් ඇති නොවන අවස්ථාව **සාර්ව ආර්ථික අසමතුලිතය යි.** මෙහි දී ආර්ථිකයේ සමස්ත ඉල්ලුම හා සමත් සමස්ත සැපයුම සමාන නොවේ.

### 1 . සමාහාර ආදයම් = සමාහාර වියදම් ප්‍රවේශය (Y=E)

කිසියම් කාලපරිච්ඡේදයක් තුළ සමස්ත ආදායම සමස්ත වියදමට සමාන වීම යන කොන්දේසිය මත සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වීම සමාහාර ආදායම් වියදම් ප්‍රවේශය තුළින් සිදු වේ.

### 2. කාන්දු වීම් = විදීම් ප්‍රවේශය (Y=E)

කිසියම් කාලපරිච්ඡේදයක් ඇතුලත ආර්ථිකයේ ආදායම් වෘත්තාකාර ප්‍රවාහයෙන් පිට වීම් (කාන්දු වීම්) එකතු වීම්වලට (විදීම්) සමාන වීම යන කොන්දේසිය මත සාර්ව ආර්ථික සමතුලිත තීරණය වීම කාන්දුවීම් හා විදීම් ප්‍රවේශය තුළින් සිදු වේ.

### 3. සමාහාර ඉල්ලුම් = සමාහාර සැපයුම් ප්‍රවේශය (AD=AS)

කිසියම් කාල පරිච්ඡේදයක් තුළ ආර්ථිකයේ සමාහාර ඉල්ලුම( AD ) සමාහාර සැපයුම( AS )ට සමාන වීම යන කොන්දේසිය මත සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වීම සමාහාර ඉල්ලුම් සැපයුම් ප්‍රවේශය තුළින් සිදු වේ.

- සමාහාර සැපයුම්

සමාහාර සැපයුම සමන්විත වන්නේ දේශීය භාණ්ඩ හා සේවා පරිභෝජනය ( C ), විදේශීය භාණ්ඩ හා සේවා පරිභෝජනය එනම් ආනයන ( M ), රජයට ගෙවන බදු ( T ) හා අනාගත පරිභෝජනය සඳහා වෙන් කරන කොටස නැතහොත් ඉතුරුම් (S ) වලිනි. ඒ අනුව


AS = C +S+T M

- සමාහාර ඉල්ලුම්

සමාහාර ඉල්ලුම ( AD ) සමන්විත වන්නේ පෞද්ගලික පරිභෝජනය ( C ) රාජ්‍ය පරිභෝජනය ( G ) ආයෝජනය ( I ) අපනයන ( X ) යනාදිය සඳහා කෙරෙන භාණ්ඩ හා සේවා ඉල්ලුමෙනි.

$$AD = C + I + G + X$$


මේ අනුව ආර්ථිකයක සමාහාර ඉල්ලුම සමාහාර වියදමට සමාන වන අවස්ථාවේදී සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වේ.




. සමාහාර ආදායම් = සමාහාර වියදම් . කාන්දු වීම් = විදීම් අනුව සමතුලිතය තීරණය වන ආකාරය අවබෝධයේ පහසුව සඳහා **සරල ,සංවෘත හා විවෘත** ආර්ථික ඔස්සේ විමසා බලමු



# සරල ආර්ථිකයක ආදායම් වියදම් චක්‍රීය ප්‍රවාහය




සරල ආර්ථිකය යනු **කුටුම්භ** හා **ව්‍යාපාර** පමණක් ඇති ආර්ථිකයකි.

එබැවින් සරල ආර්ථිකයක

සමාහාර ඉල්ලුම (වියදම) ⟶ E = C + I

සමාහාර සැපයුම (ආදායම) ⟶ Y = C + S

ගිලිහීම් /කාන්දුවීම් ⟶ W = S

ඇතුලුවීම් / විදීම් ⟶ J = I

## සරල ආර්ථිකයක සමතුලිතය

1 සමාහාර ආදායම = සමාහාර වියදම

Y = E

C + S = C + I

- සරල ආර්ථිකයක ආදායම

1 පරිභෝජන වියදම් හා

2 ඉතුරුම් වලින් සමන්විත වේ

### 1 පරිභෝජන වියදම්

කුටුම්බ විසින් පරිභෝජන සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට දරන වියදම් කුටුම්බ පරිභෝජන වියදම් වේ.කුටුම්භ පරිභෝජන වියදම් තීරණය වන්නේ කුටුම්භ වල වැය කලහැකි ආදායම මතයි

$$C = f\ (yd)$$

මෙම සම්බන්ධතාව ශ්‍රිතාත්මක ව පහත දැක්විය හැකි ය.

- C = පෞද්ගලික පරිභෝජන වියදම
- Yd = වැය කළ හැකි ආදායම

### පරිභෝජන ශ්‍රිතය

වැය කළ හැකි ආදායම හා පරිභෝජනය අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින බැවින් පරිභෝජන ශ්‍රිතය පහත ලෙස දැක්විය හැකි ය.

$$C = a + byd$$

C = කුටුම්බ පරිභෝජන වියදම

a = ස්වායත්ත පරිභෝජනය

b = ආන්තික පරිභෝජන නැඹියාව

Yd = වැය කළ හැකි ආදායම

මුළු පරිභෝජනය (C) = ස්වායත්ත පරිභෝජනය (a) + පෙළඹුණ පරිභෝජන වියදම්

- ස්වායත්ත පරිභෝජන වියදම්

පරිභෝජන ශ්‍රිතයේ "a" සංගුණකයෙන් පෙන්නුම් කරනුයේ ස්වායත්ත පරිභෝජනය යි. ආදායම ශූන්‍ය අවස්ථාවේ දී සිදුවන පරිභෝජන වියදම් ස්වායත්ත පරිභෝජනය යි. එනම් ආදායම් බලපෑමකින් තොර ව සිදු කරන පරිභෝජනය යි.

- ආන්තික පරිභෝජන නැමියාව (MPC)

පරිභෝජන ශ්‍රිතයේ "b" සංගුණකයෙන් පෙන්නුම් කරනුයේ ආන්තික පරිභෝජන නැමියාව යි. ආන්තික පරිභෝජන නැමියාව (MPC) යනු වැය කළ හැකි ආදයම වෙනස් වීමට සාපේක්ෂ ව පරිභෝජනයේ වෙනස් වන අනුපාතය යි. එනම් ආදායම එක ඒකකයකින් වෙනස් වන විට පරිභෝජනය කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේ ද යන්න යි.

$$b = (MPC) = \frac{\triangle C}{\triangle Y}$$


$\triangle C$ = පරිභෝජනයේ වෙනස්වීම

$\triangle Y$ = ආදායමේ වෙනස්වීම

$$b = (MPC) = \frac{\text{පරිභෝජනයේ වෙනස}}{\text{ආදායමේ වෙනස}}$$

සරල ආර්ථිකයක බදු හා සංක්‍රාම දක්නට නොමැති නිසා y = yd වේ

පරිභෝජන රේඛාවේ බෑවුම ΔC වලින් පෙන්නුම් කෙරෙන්නේ ආන්තික පරිභෝජන නැමියාව යි (MPC).




## 2 ඉතුරුම්

වැය කළ හැකි ආදායමෙන් පරිභෝජනය නොකරන කොටස කුටුම්බ ඉතුරුම් ය. ඉතුරුම් රඳා පවතින්නේ පහත පරිදි වැය කළ හැකි ආදායම මත ය. මෙය ශ්‍රිතාත්මක ව පහත පරිදි වේ.

S = කුටුම්බ ඉතුරුම්

Y = ආදායම

C = පරිභෝජන වියදම්

$$S = Y - C$$

- ඉතුරුම් ශ්‍රිතය

$$\mathbf{S = -a + (1 - b)\, Yd}$$

ඉහත ශ්‍රිතයට පරිභෝජන ශ්‍රිතය ආදේශ කළ පසු ලැබෙන ඉතුරුම් ශ්‍රිතය පහත ලෙසින් දැක්විය හැකිය

$$S = Y - C$$

$$S = Y - (a+bYd)$$

$$S = Y - a - bYd$$

$$\mathbf{S = -a + (1 - b)\, Yd}$$

- නිර්-ඉතුරුම් (සෘණ ඉතුරුම්)**(– a)**

නිර්-ඉතුරුම් යනු ශුන්‍ය ආදායම් මට්ටමක දී හට ගන්නා පරිභෝජන වියදම් වේ. පරිභෝජන වියදම් වැය කළ හැකි ආදායමට සමාන වන තුරු පවතින්නේ නිර්-ඉතුරුම් ය. ආදායම් ශුන්‍ය අවස්ථාවලදී කලින් රැස්කර ගත් ඉතුරුම් යොදාගෙන පරිභෝජන කරයි. ඉතුරුම් පහළ වැටෙන නිසා එම තත්ත්වය නිර්-ඉතුරුම් ලෙස හැඳින් වේ.

### ආන්තික ඉතුරුම් නැම්යාව(1 – b) ( MPS)


ආන්තික ඉතුරුම් නැම්යාව යනු වැය කළ හැකි ආදායමේ වෙනස් වීමට සාපේක්ෂ ව ඉතිරි කිරීම් වෙනස් වන අනුපාතය යි. එනම් ආදායම එක ඒකකයකින් වෙනස් වන විට ඉතුරුම් කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේ ද යන්නයි.

$$(MPs) = \frac{\Delta s}{\Delta y}$$

සරල ආර්ථිකයක $y = c + s$ නිසා

Mpc + MPs = 1 වේ එබැවින් MPS = 1 - b ද වේ

ඉතුරුම් ශ්‍රිතය හා සම්බන්ධ ඉතුරුම් රේඛාව




පරිභෝජන වියදම් ආදායමට සමාන වන අවස්ථාවේ පටන් ඉතුරුම් ධන වේ

- සාමාන්‍ය පරිභෝජන නැමියාව (APC)

වැය කළ ආදායම සහ මුළු පරිභෝජනය අතර අනුපාතය සාමාන්‍ය පරිභෝජන නැමියාව (APC) වේ. වැය කළ මුළු ආදායමෙන් කොපමණ ප්‍රමාණයක් පරිභෝජනයට යොදාගන්නේ ද යන්න සාමාන්‍ය පරිභෝජන නැමියාවෙන් ප්‍රකාශ වේ.
සාමාන්‍ය පරිභෝජන නැමියාව පහත ලෙස ගණනය කළ හැකි ය.

$$\text{සාමාන්‍ය පරිභෝජන නැමියාව (APC)} = \frac{\text{පරිභෝජන වියදම}}{\text{වැය කළ හැකි ආදායම}}$$

- සාමාන්‍ය ඉතුරුම් නැමියාව (APS)

මුළු ඉතුරුම් සහ මුළු ආදායම අතර අනුපාතය සාමාන්‍ය ඉතුරුම් අනුපාතය වේ. මුළු ආදායමෙන් කොපමණ ප්‍රමාණයක් ඉතුරුම්වලට යොදවන්නේ ද යන්න සාමාන්‍ය ඉතුරුම් නැමියාවෙන් (APS) ප්‍රකාශ වේ. ඉතුරුම් ප්‍රමාණය එම අවස්ථාවේ වැය කළ හැකි ආදායමෙන් බෙදීමෙන් සාමාන්‍ය ඉතුරුම් නැමියාව (A.P.S) ගණනය කළ හැකි ය.

$$\text{සාමාන්‍ය ඉතුරුම් නැමියාව (APs)} = \frac{\text{ඉතුරුම්}}{\text{වැය කළ හැකි ආදායම}}$$

Activity 1

1 1 පහත වගුව සම්පූර්ණ කරන්න

| Yd | C | S | APC | APS |
|---|---|---|---|---|
| 0 | 50 | -50 | | |
| 100 | 125 | | | |
| 200 | 200 | | | |
| 300 | 275 | | | |
| 400 | 350 | | | |

1 2 පරිභෝජන හා ඉතුරුම් වක්‍ර අඳින්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

1 3 පරිභෝජන හා ඉතුරුම් ශ්‍රිත ගොඩනගන්න

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................


# සරල ආර්ථිකයක සමාහාර වියදම්

1 පරිභෝජන වියදම් හා

2 ආයෝජන වියදම් වලින් සමන්විත වේ

## ආයෝජනය වියදම (I)

ආයෝජනය වියදම ආදායම මත තීරණය නොවන ස්වායත්ත වියදමක් ලෙස උපකල්පනය කෙරෙන නිසා ආයෝජන වියදම් රේඛාව තිරස් අක්ෂයට සාමාන්තර සරල රේඛාවක් සේ පිහිටයි.




ආයෝජන වක්‍රයේ බෑවුම ශූන්‍ය අගයක් ගනී. ආර්ථිකයේ ආයෝජනය විදීම්වලට අයත් සංරචකයකි.

සරල ආර්ථිකයක සමතුලිතයේදී

<u>1 Y = E</u>

නිදසුන :

C = 200 + 0.8 Yd
S = - 200 + 0.2 Yd

I = 500

1 වියදම් ශ්‍රිතය ගොඩ නගන්න

$Y = E$

$E = C + I$

$E = 200 + 0.8\,Yd + 500$

$\underline{E = 700 + 0.8\,Yd}$

2 සමතුලිත නිමැවුම් මට්ටම සොයන්න

$E = 700 + 0.8\ Yd$

$Y = 700 + 0.8Yd$

$Y - 0.8Yd = 700$

$0.2\ Yd = 700$

$\underline{Y = 3500}$

$\underline{2\ W = J}$

3 කාන්දුවීම් හා විදීම් ඇසුරින් සමතුලිතය

$W = j$

$S = I$

$-200 + 0.2\ Yd = 500$

$0.2\ Yd = 700$

$\underline{Yd = 3500}$

4 සමතුලිතයේදී පරිභෝජනය

$C = 200 + 0.8\ Yd$

$C = 200 + 0.8\ (3500)$

$C = 200 + 2800$

$\underline{C = 3000}$

4 සමතුලිතයේදී ඉතුරුම්

$S = -200 + 0.2\ Yd$

$S = -200 + 0.2\ (3500)$

$S = -200 + 700$

$\underline{S = 500}$

Activity 2

C = 100 + 0.5 Yd

I = 100

1 වියදම් ශ්‍රිතය ගොඩ නගන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

2 සමතුලිත නිමැවුම් මට්ටම සොයන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

3 ඉතුරුම් ශ්‍රිතය ගොඩනගන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

4 කාන්දුවීම් හා විදීම් ඇසුරින් සමතුලිතය සොයන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

5 සමතුලිතයේදී පරිභෝජනය

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

6 සමතුලිතයේදී ඉතුරුම්

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

7 සමතුලිතයේදී  ඉතුරුම ආයෝජනයට සමාන බව පෙන්වන්න

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

………………………………………………………………………………………

## සංවෘත ආර්ථිකයක සමතුලිතය

සරල ආර්ථිකයකට රජය මැදිහත්වීමත් සමග එය සංවෘත ආර්ථිකයක් බවට පත්වේ


මෙහිදී

- Yd = ( Yd – t + r )
- රාජ්‍ය වියදම් (G) දක්නට ලැබෙයි

### රාජ්‍ය මිලදී ගැනීම්(G)

රාජ්‍ය මිලදී ගැනීම්(G) ද ආදායම මත තීරණය නොවන ස්වායත්ත වියදමක් ලෙස උපකල්පනය කෙරෙන නිසා ස්වායත්ත වියදමකි. රාජ්‍ය මිලදී ගැනීම්වලට නිදසුන් ලෙස ජාතික ආරක්ෂාව, අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහණය වැනි රාජ්‍ය සේවා පවත්වාගෙන යාමට කරන වියදම් දැක්විය හැකි ය. මුළු රාජ්‍ය මිලදී ගැනීම් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට කරන ලද වියදම් සහ රාජ්‍ය සංක්‍රාම වියදම්වලින් සමන්විත වේ. විශ්‍රාම වැටුප් සහ පොහොර සහනාධාර සංක්‍රාම වියදම්වලට නිදසුන් වේ.

- රාජ්‍ය මිලදී ගැනීම් වක්‍රය පහත පරිදි දැක්විය හැකි ය.




සංවෘත ආර්ථිකයක සමතුලිතය

1 සමාහාර ආදායම = සමාහාර වියදම

$Y = C + S + T \quad = \quad E = C + I + G$

2 කාන්දුවීම් = විදීම්

$S + T = I + G$

නිදසුන ඃ

C = 200 + 0.8 Yd

S = - 200 + 0.2 Yd

I = 500 G = 300 T = 150 R = 50

1 Y = E

1 වියදම් ශ්‍රිතය ගොඩ නගන්න

Y = E

E = C + I + G

E = 200 + 0.8 Yd + 500 + 300

E = 1000 + 0 . 8 Yd

2 සමතුලිත නිමැවුම් මට්ටම සොයන්න

E = 1000 + 0.8 Yd

Y = 1000 + 0.8( Y – T + r )

Y = 1000 + 0.8 ( y – 150 + 50 )

Y = 1000+ 0.8 y -120 + 40

Y = 1000 + 0.8y – 80

Y = 920 + 0.8y

Y – 0.8y = 920

0.2 y = 920

Y = 4600

$2 \; W = J$

3 කාන්දුවීම් හා විදීම් ඇසුරින් සමතුලිතය සොයන්න

$W = J$

$S + T = I + G$

$S + (T - r) = I + G$

$-200 + 0.2\,Yd + (150 - 50) = 500 + 300$

$-100 + 0.2yd = 800$

$-100 + 0.2\,(Y - 150 + 50) = 800$

$-100 + 0.2y - 30 + 10 = 800$

$-120 + 0.2y = 800$

$0.2y = 920$

$\underline{Y = 4600}$

සංවෘත ආර්ථිකයක වැයකළ කලහැකි ආදායමට බදු හා සංක්‍රාම යන දෙවර්ගයම බලපායි

## *විවෘත ආර්ථිකයක සමතුලිතය (සාර්ව ආර්ථිකයක සමතුලිතය)*

මෙහිදී

1 අපනයන

2 ආනයන සංවෘත ආර්ථිකයට අමතරව විවෘත ආර්ථිකයේ දක්නට ලැබෙයි

1 සමාහාර ආදායම = සමාහාර වියදම

$$E = C + I + G + X - M$$

2 කාන්දුවීම් = විදීම්

$$S + T + M = I + G + X$$

සාර්ව ආර්ථික සමතුලිත කොන්දේසි

| ආර්ථිකය | $Y = E$ | $W = J$ |
|---|---|---|
| සරල | $Y = C + I$ | $S = I$ |
| සංවෘත | $Y = C + I + G$ | $S + T = I + G$ |
| විවෘත | $Y = C + I + G + NX$ | $S + T + M = I + G + X$ |

## සමාහාර ආදායම = සමාහාර වියදම් ප්‍රවේශය හරහා සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය

## සමාහාර ආදයම් = සමාහාර වියදම් ප්‍රවේශය (Y=E)

- සමාහාර වියදම්

කිසියම් කාලපරිච්ඡේදයක් තුළ ආර්ථිකයේ කාරකයක් භාණ්ඩ සහ සේවා මිලදී ගැනීම සඳහා වැය කරනු ලබන වියදම සමාහාර වියදම ලෙස හැඳින්වේ.

- සමාහාර වියදමට අයත් සංරචක පහත පරිදි දැක්විය හැකි ය.
  - පරිභෝජන වියදම (C)
  - ආයෝජන වියදම (I)
  - රජයේ මිලදී ගැනීම් (G)
  - ශුද්ධ අපනයනය Nx(X-M)

ආර්ථිකයක් සාර්ව ආර්ථික සමතුලිතයට පත් වන විට සමස්ත ආදායම (Y) සමාහාර වියදමට (E) සමාන වේ.

**Y** වලින් අදහස් වන්නේ සමස්ත නිමැයුම(සමස්ත ආදායම)යි.

ආර්ථිකයක සමස්ත වියදම(E) කුටුම්බ පරිභෝජනය **(C)**, ආයෝජන වියදම **(I)**, රාජ්‍ය මිළදී ගැනීම් **(G)** සහ ශුද්ධ අපනයනවලින් **(X-M)** සමන්විත ය.


- **E = C+I+G+ (X-M)**

- සමාහාර ආදායම = සමාහාර වියදම් ප්‍රවේශය හරහා සාර්ව ආර්ථිකයක සමතුලිතය තීරණය වන ආකාරය පහත දැක්වෙන සංඛ්‍යා වගුව මගින්ඉදිරිපත් කළ හැකි ය.

| Y | Yd | C | I | G | X | M | X- M | E |
|---|---|---|---|---|---|---|---|---|
| 0 | -250 | 400 | 200 | 300 | 200 | 300 | -100 | 800 |
| 2000 | 1750 | 2000 | 200 | 300 | 200 | 300 | -100 | 2400 |
| **4000** | **3750** | **3600** | **200** | **300** | **200** | **300** | **-100** | **4000** |
| 6000 | 5750 | 5200 | 200 | 300 | 200 | 300 | -100 | 5600 |
| 8000 | 7750 | 6800 | 200 | 300 | 200 | 300 | -100 | 7200 |
| 10000 | 9750 | 8400 | 200 | 300 | 200 | 300 | -100 | 8800 |

ඉහත සංඛ්‍යා වගුව අනුව රු.මි.4000 ආදායම් මට්ටම දී සමස්ත වියදමේ වටිනාකම සමස්ත ආදායමට සමාන වන නිසා සාර්ව ආර්ථික සමතුලිතය රු.මි. 4000 ආදායම් මට්ටම දී සිදු වේ. මෙහි දී ආර්ථිකයේ සමස්ත ඉල්ලුමට සරිලන සමස්ත නිෂ්පාදනයක් ඇති වේ. අනෙකුත් සෑම ආදායම් මට්ටමක දී ම සමස්ත වියදමේ වටිනාකම සමස්ත ආදායමට සමාන නොවන නිසා සාර්ව ආර්ථික සමතුලිතයක් සිදු නොවේ.

- සමාහාර ආදායම = සමාහාර වියදම් ප්‍රවේශය හරහා සාර්ව ආර්ථිකයක සමතුලිතය තීරණය වන ආකාරය පහත දැක්වෙන ප්‍රස්තාර සටහන මගින් ඉදිරිපත් කළ හැකි ය.




ඉහත ප්‍රස්තාර සටහනේ සමස්ත වියදම **(E)** සිරස් අක්ෂයෙන් දැක්වෙන වන අතර වැය කළ හැකි ආදායම **(Yd)** තිරස් අක්ෂයෙන් දැක්වෙයි.

ඉහත ප්‍රස්තාර සටහනේ සමතුලිත ආදායම් වියදම් රේඛාව (අංශක 45₀ රේඛාව) මූල ලක්ෂයෙන් ආරම්භ වී වමේ සිට දකුණට ඉහළට බෑවුම් වේ.

එම ප්‍රස්තාර සටහනේ **a** ලක්ෂයේ දී සමස්ත ආදායම **(Y)** සමස්ත වියදමට **(E)** සමාන වී ඇත. ඒ අනුව සමතුලිත නිමැවුම් මට්ටම 4000කි.

- සමාහාර ආදායම = සමාහාර වියදම් ප්‍රවේශය මගින් සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය සමීකරණ ඇසුරින්

**Y = E**

**E = C + I + G + (X-M)**

පරිභෝජන ශ්‍රිතය **(C) = (C = 500 + 0.8yd)**

ආයෝජන වියදම **(I) = 300**

රාජ්‍ය ආදායම **(G) = 400**

ශුද්ධ අපනයන **(X-M) = -200**

වැය කළ හැකි ආදායම **(Y-T) = yd**

ස්වාධීන බදු **(T) = 200**

**Y = E**

**Y=C+I+G+(X-M)**

Y = 500 + 0. 8 yd + 300 + 400 + (- 200)

Y = 1000 + 0.8 yd

Y = 1000 + 0.8 ( y – 200 )

Y = 1000+ 0.8y - 160

Y = 840 + 0.8 y

Y – 0.8 y = 840

0.2 y = 840

Y = 4200

Activity 3

පරිභෝජන ශ්‍රිතය **(C) = (C = 300 + 0.5yd)**

ආයෝජන වියදම **(I) = 100**

රාජ්‍ය ආදායම **(G) = 200**

ශුද්ධ අපනයන **(X-M) = -100**

වැය කළ හැකි ආදායම **(Y-T) = yd**

ස්වාධීන බදු **(T) = 100**

1 සමතුලිත ජාතික ආදායම සොයන්න

…………………………………………………………………………………………………

…………………………………………………………………………………………………

…………………………………………………………………………………………………

…………………………………………………………………………………………………

…………………………………………………………………………………………………

***කාන්දුවීම් විදීම් ප්‍රවේශය මඟින් ආර්ථිකය සමතුලිත නිමැවුම තීරණය වන ආකාරය***

- කාන්දුවීම්

කිසියම් කාලපරිච්ඡේදයක් තුළ චක්‍රීය ආදායම් වෘත්තාකාර ප්‍රවාහයන් සිදුවන ගිලිහීම් කාන්දුවීම ලෙස හඳුන්වයි. ආර්ථිකයක කාන්දු වීම් ස්වරූප තුනකි. එනම්

- ඉතුරුම් **(S)**

  ඉතුරුම් වැය කළ හැකි ආදායමෙන් පරිභෝජනය සඳහා වැය නොකරන කොටස යි.

- ස්වාධීන බදු **(T)**

ස්වාධීන බදු කුටුම්බ වෙත ලැබෙන් ආදායමෙන් රජය වෙත, මාරු වන කොටස යි.

- ආනයන **(M)**

ඉතුරුම්, ස්වාධීන බදු සහ ආනයන වියදම් හේතුවෙන් සමස්ත වියදම් ප්‍රවාහය සංකෝචනය වේ.

- විදීම්

මුළු විදීම් වටිනාකම චක්‍රීය ආදායම් ප්‍රවාහය ශක්තිමත් කිරීමට හේතු වන අතර විදීම් චක්‍රීය ආදායම් ප්‍රවාහය ප්‍රසාරණය කිරීමට හේතු වේ.

- ස්වාධීන ආයෝජන **(I)**
- ස්වාධීන රාජ්‍ය වියදම් **(G)**
- අපනයන **(X)**

කාන්දුවීම් වටිනාකම චක්‍රීය ආදායම් ප්‍රවාහය දුර්වල කිරීමට හේතු වන අතර මුළු විදීම් (එකතු වීම්) වටිනාකම චක්‍රීය ආදායම් ප්‍රවාහණ ශක්තිමත් කිරීමට හේතු වේ. මෙම නිසා ඒවා එකිනෙකට සමාන වීම තුළින් සාර්ව ආර්ථික සමතුලිතය ඇති වේ. ආර්ථිකයේ එම කොන්දේසිය පහත දැක්වෙන ලෙස ප්‍රකාශ කළ හැකි ය.

**W = J**


**S +T + M = I + G + X**

- කාන්දු වීම් = විදීම් ප්‍රවේශය මගින් සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය පහත පරිදි සංඛ්‍යා ලේඛන මගින්ඉදිරිපත් කළ හැකි ය.

| ආදායම **(Y)** | ඉතුරුම් **(S)** | ස්වාධීන බදු **(T)** | ආනයන **(M)** | ආයෝජනය **(I)** | රාජ්‍ය වියදම **(G)** | අපනයන **(X)** | මුළු කාන්දුවීම් **(W)** | මුළු විදීම් **(J)** |
|---|---|---|---|---|---|---|---|---|
| 0 | -650 | 250 | 300 | 200 | 300 | 200 | -100 | 700 |
| 2000 | -250 | 250 | 300 | 200 | 300 | 200 | 300 | 700 |
| **4000** | **150** | **250** | **300** | **200** | **300** | **200** | **700** | **700** |
| 6000 | 550 | 250 | 300 | 200 | 300 | 200 | 0 | 700 |
| 8000 | 950 | 250 | 300 | 200 | 300 | 200 | 1500 | 700 |
| 10000 | 1350 | 250 | 300 | 200 | 300 | 200 | 1900 | 700 |

ආර්ථිකයේ මුළු කාන්දු වීම් වටිනාකම මුළු විදීම් වටිනාකමට සමාන වන්නේ රු.මි 4000 ආදායම් මට්ටම දී ය. එම අවස්ථාවේ දී සාර්ව ආර්ථික සමතුලිතය සිදු වේ.

- කාන්දුවීම් = විදීම් ප්‍රවේශය මගින්සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය පහත පරිදි ප්‍රස්තාර සටහන් මගින්ඉදිරිපත් කළ හැකි ය.




ඉහත ප්‍රස්තාර සටහනේ මූල ලක්ෂයට පහළින් කාන්දු වීම් රේඛාව ආරම්භ වේ.

- එම ප්‍රස්තාර සටහනේ විදීම් රේඛාව ආරම්භ වන්නේ මූල ලක්ෂ්‍යයට ඉහළින් ය. එය ආදායම් අක්ෂයට සමාන්තර වේ.
- ඉහත ප්‍රස්තාර සටහනේ **a** ලක්ෂ්‍යයේ දී කාන්දු වීම් රේඛාව සහ විදීම් රේඛාව ඡේදනය වන අතර එම ලක්ෂයේ දී සාර්ව ආර්ථික සමතුලිතය ඇති වේ. එම ලක්ෂ්‍යයේ දී ආදායම් මට්ටම රු.මි 4000 වන නිසා සමතුලිත ආදායම් මට්ටම රු.මි 4000 වේ.

- කාන්දු වීම් = විදීම් ප්‍රවේශය මගින්සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය පහත පරිදි සමීකරණ ඇසුරෙන් ඉදිරිපත් කළ හැකි ය.

$$W = J$$

$$S + T + M = I + G + X$$

නිදසුන් **:** රු. මිලියන

- ඉතුරුම් **(S) = 150**
- ස්වාධීන බදු **(T) = 250**
- ආනයනය **(M) = 300**
- මුළු කාන්දු වීම් වටිනාකම **(W) = 700**
- ආයෝජන **(I) = 200**
- රාජ්‍ය වියදම **(G) = 300**
- අපනයන **(X) = 200**
- මුළු විදීම් වටිනාකම **(J) = 700**

$$W = J$$

$$S + T + M = I + G + X$$

$$150+250+300 = 200 + 300 + 200$$

$$700 = 700$$ (රු. මිලියන)

**C=600+0.8Yd** පරිභෝජන ශ්‍රිතය ඇසුරෙන් ඉතුරුම් ශ්‍රිතය **S=(-600)+0.2Yd** ලෙස ආදේශ කර

$$-600 + 0.2yd + 250 + 300 = 200 + 300 + 200$$

$$-600 + 0.2 ( y - 250) + 550 = 700$$

$$-650 + 550 + 0.2 y = 700$$

$$0.2y = 700 + 100$$

$$0.2 Y = 800$$

$$\underline{Y = 4000}$$

**Activity 4**

C = 80 + 0.9 yd

I = 100

G = 70

T a = 50

X = 20 M = 10

1 සමතුලිත තිමැවුම සොයන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

2 W = J බව පෙන්වන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

3 සමතුලිතය ප්‍රස්ථාරිකව දක්වන්න

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

# සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වීම

සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වීමට පහත සඳහන් සාධක බලපායි.

- පරිභෝජන ශ්‍රිතය වෙනස් වීම
- ස්වාධීන ආයෝජන වෙනස් වීම
- රාජ්‍ය මිල දී ගැනීම් වෙනස් වීම
- ස්වාධීන බදුවල වෙනස් වීම
- සංක්‍රාම වියදම් වෙනස් වීම

- පරිභෝජන ශ්‍රිතය වෙනස් වීම


ස්වාධීන පරිභෝජනය හෝ ආන්තික පරිභෝජනය නැමියාව හෝ වෙනස් වීම අනුව පරිභෝජන ශ්‍රිතය වෙනස් වේ. මෙම නිසා ස්වාධීන පරිභෝජනය හෝ ආන්තික පරිභෝජනය නැමියාව වෙනස් වීම අනුව සාර්ව ආර්ථික සමතුලිතය ද වෙනස් වේ.

1 ස්වාධීන පරිභෝජනය වෙනස් වීම අනුව සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වන ආකාරය

| | | |
|---|---|---|
| C = 100 + 0.8 yd<br>I = 200<br>Y = 100 + 0.8 yd + 200<br>Y = 300 + 0 . 8 yd<br>Y - 0.8 yd = 300<br>0.2 yd = 300<br><u>Y = 1500</u> | ස්වාධීන පරිභෝජනය<br>200 ලෙස වෙනස් වුවහොත්<br>→ | C = 200 + 0.8 yd<br>I = 200<br>Y = 200 + 0.8 yd + 200<br>Y = 400 + 0 . 8 yd<br>Y - 0.8 yd = 400<br>0.2 yd = 400<br><u>Y = 2000</u> |

ස්වාධීන පරිභෝජනය 100 සිට 200 දක්වා වෙනස් වීමේදී සමතුලිත ජාතික ආදායම 1500 සිට 2000 දක්වා වෙනස් විය

- ස්වාධීන පරිභෝජනය වෙනස් වීම අනුව සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වන ආකාරය ප්‍රස්තාර සටහනකින්




2 ආන්තික පරිභෝජන නැමියාව වෙනස් වීම නිසා සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වීම

C = 100 + 0.8 yd

I = 200

Y = 100 + 0.8 yd + 200

Y = 300 + 0 . 8 yd

Y - 0.8 yd = 300

0.2 yd = 300

<u>Y = 1500</u>

ආන්තික පරිභෝජන නැමියාව 0.8 සිට 0.5 දක්වා වෙනස් වීමේදී →

C = 100 + 0.5 yd

I = 200

Y = 100 + 0.5 yd + 200

Y = 300 + 0 . 5 yd


Y - 0.5 yd = 300

0.5 yd = 300

<u>Y = 600</u>

ආන්තික පරිභෝජන නැමියාව 0.8 සිට 0.5 දක්වා වෙනස් වීම නිසා සමතුලිත ජාතික ආදායම 1500 සිට 600 දක්වා අඩු වෙයි

- ස්වාධීන පරිභෝජනය ස්ථාවර මට්ටමක දී ආන්තික පරිභෝජන නැමියාව පහළ යෑම නිසා සමතුලිත ආදායම වෙනස් වීම පහත දැක්වෙන ප්‍රස්තාර සටහනින්




ස්වාධීන ආයෝජන වෙනස් වීම

ආර්ථිකයෙහි ස්වාධීන ආයෝජන වියදම් වෙනස් වූ විට සමතුලිත ජාතික ආදායම වෙනස් වේ.

නිදසුන

- ආර්ථිකයෙහි ආයෝජනය = 200
- පරිභෝජනය C = 100 + 0.8 yd
- රාජ්‍ය මිල දී ගැනීම් = 300
- බදු = 100
- ශුද්ධ අපනයන = - 100

Y = C + I + G + X - M

Y =100 + 0.8 (Y – T ) +200 +300+(100)

Y =500 + 0.8 (y – 100)

Y = 500 + 0.8y - 80

Y = 420 + 0.8y

Y – 0.8y = 420

0.2 y = 420

Y = 2100

ආයෝජන වියදම් 200 සිට 300 දක්වා →

Y = C + I + G + X - M

Y =100 + 0.8 (Y – T ) +**300** +300+(100)

Y =600 + 0.8 (y – 100)

Y = 600 + 0.8y + 80


Y = 520 + 0.8y

Y – 0.8y = 520

0.2 y = 520

Y =2600

මෙහි දී ආයෝජන වියදම් 100 වැඩි වන විට සමතුලිත ජාතික නිෂ්පාදනය ආදායම 2100 සිට 2600 දක්වා ඉහළ ගොස් ඇත එය ආර්ථික ප්‍රසාරණ කි




ඉහත ප්‍රස්තාර සටහනට අනුව අයෝජන වියදම් වැඩි වන විට සමස්ත වියදම ඉහළ ගොස් සමාහාර ඉල්ලුම වක්‍රය $E_1$ සිට $E_2$ දක්වා ඉහළට විතැන් වේ. ඒ අනුව සමතුලිත නිෂ්පාදන 2900 සිට 3400 දක්වා ඉහළ යයි.

- රාජ්‍ය මිල දී ගැනීම් වෙනස් වීම


රාජ්‍ය මිල දී ගැනීම් වෙනස් වීම් තුළින් ද සමතුලිත නිෂ්පාදනය වෙනස් වේ.

නිදසුන

- ආර්ථිකයෙහි ආයෝජනය = 200 - පරිභෝජනය C = 100 + 0.8 yd
- රාජ්‍ය මිල දී ගැනීම් = 300 - බදු = 100
- ශුද්ධ අපනයන = - 100

| | | |
|---|---|---|
| Y = C + I + G + X - M | | Y = C + I + G + X - M |
| Y =100 + 0.8 (Y – T ) +200 +300+(100) | | Y =100 + 0.8 (Y – T ) +200 +**450**+(100) |
| Y =500 + 0.8 (y – 100) | | Y =650 + 0.8 (y – 100) |
| Y = 500 + 0.8y - 80 | රාජ්‍ය මිල දී ගැනීම් | Y = 650 + 0.8y + 80 |
| Y = 420 + 0.8y | 300 සිට 450 දක්වා → | Y = 570 + 0.8y |
| Y – 0.8y = 420 | | Y – 0.8y = 570 |
| 0.2 y = 420 | | 0.2 y = 570 |
| Y = 2100 | | Y = 2850 |

මෙහි දී රාජ්‍ය මිල දී ගැනීම් 150වැඩි වන විට සමතුලිත ජාතික නිෂ්පාදනය ආදායම 2100 සිට 2850 දක්වා ඉහළ ගොස් ඇත එය ආර්ථික ප්‍රසාරණ කි




- ස්වාධීන බදුවල වෙනස් වීම
  ආර්ථිකයේ රජය විසින් බදු අය කිරීම වෙනස් කිරීම් තුළින් ද සමතුලිත ජාතික නිමවුම වෙනස් වේ.

නිදසුන

- ආර්ථිකයෙහි ආයෝජනය = 200 - පරිභෝජනය C = 100 + 0.8 yd
- රාජ්‍ය මිල දී ගැනීම් = 300 - බදු = 100
- ශුද්ධ අපනයන = - 100

| | | |
|---|---|---|
| Y = C + I + G + X - M | | Y = C + I + G + X - M |
| Y =100 + 0.8 (Y – T ) +200 +300+(100) | | Y =100 + 0.8 (Y – T ) +200 +300+(100) |
| Y =500 + 0.8 (y – 100) | ස්වාධීන බදු | Y =500 + 0.8 (y – 200) |
| Y = 500 + 0.8y - 80 | 100 සිට 200 දක්වා → | Y = 500 + 0.8y - 160 |
| Y = 420 + 0.8y | | Y = 340 + 0.8y |
| Y – 0.8y = 420 | | Y – 0.8y = 340 |
| 0.2 y = 420 | | 0.2 y = 340 |
| Y = 2100 | | Y = 1700 |

බදු අය කිරීම් වැඩි කළ විට සමතුලිත නිමවුම අඩු වන අතර බදු ගෙවීම් අඩු කළ විට සමතුලිත නිමවුම් මට්ටම ඉහළ යයි.



## ගුණක ක්‍රියාවලිය

සමාහාර ඉල්ලුම සංරචක වෙනස් වීම මත සාර්ව ආර්ථික සමතුලිතය වෙනස්වීම් ගුණක ක්‍රියාවලිය ඇසුරින් පෙන්වා දෙයි. එනම් ස්වාධීන වියදමේ සංරචකයක් වෙනස් වීම නිසා සමතුලිත ආදායමේ ඇති වන වෙනස් වීම විග්‍රහ කරන්නේ ගුණක ක්‍රියාවලියෙනි.

ස්වාධීන වියදමේ වෙනස් වීම නිසා ආදායම් මට්ටම කිහිප ගුණකයකින් වෙනස් වීම ගුණක ප්‍රතිවිපාකය (Multiplier effect) ලෙස හැඳින්වේ.

ස්වාධීන වියදම් ඉහළ යෑම හෝ පහළ යෑම හෝ නිසා සමතුලිතය වෙනස් වීම ගුණකයේ විශාලත්වය අනුව සිදු වේ.

ආර්ථිකයේ කිසියම් ස්වාධීන වියදමක් යම්කිසි ප්‍රමාණයකින් වැඩි වන විට සමතුලිත නිමැවුම කොපමණ ප්‍රමාණයකින් වැඩි වේදැයි පෙන්වන සංගුණකය ගුණකය ලෙස හඳුන්වයි.

### වියදම් ගුණකය

සාමාන්‍යයෙන් සරල ආර්ථිකයක ගුණකය පහත පරිදි දැක්විය හැකි ය.

K= 1/(1-b) = 1/ (1-MPC) = 1/ (MPS)

$$K = \frac{1}{MPS}$$

නිදසුන (සියළු සංඛ්‍යා බිලියන වලිනි)

C = 2000 + 0.75 yd

I = 4000

1 සමතුලිත ජාතික ආදායම සොයන්න

Y = c + I

Y = 2000 + 0.75yd + 4000

Y = 6000 + 0.75 yd

Y - 0.75yd = 6000

0.25yd = 6000

<u>Y =24000</u> ( බිලියන )

2 වියදම් ගුණකය ගණනය කරන්න

$$K= \frac{1}{1-b}$$

$$\frac{1}{1-0.75}$$

$$\frac{1}{0.25}$$

K = 4

3 ආයෝජනය 1000 කින් වැඩිවුවහොත් නව සමතුලිතය → $\Delta y = K \times \Delta I$

$\Delta y = K \times \Delta I$

$= 4 \times 1000$

$= 4000$

නව සමතුලිතය = 24000 + 4000

= 28000 (බිලියන )

ආයෝජනය 1000 කින් වැඩි කිරීමේදී සමතුලිතය 24000 සිට 28000 දක්වා වැඩි විය

4 ස්වාධීන පරිභෝජනය 500 කින් අඩුවුවහොත් නව සමතුලිතය → $\Delta y = K \times \Delta Co$

$\Delta y = K \times \Delta Ca$

$= 4 \times 500$

$= 2000$

නව සමතුලිතය = 24000 -2000


= 22000 (බිලියන )

ස්වාධීන පරිභෝජනය 500 කින් අඩුවු විට සමතුලිතය 24000 සිට 22000 දක්වා අඩු විය

5 ඉහත සමතුලිත වෙනස්වීම් රූප සටහන් මගින් දක්වන්න


ආයෝජනය 1000

කින් වැඩිවුවහොත් නව සමතුලිතය




ස්වාධීන පරිභෝජනය 500

කින් අඩුවුවහොත් නව සමතුලිතය



සංවෘත ආර්ථිකයක ගුණකය

මෙහිදී 1 රාජ්‍ය වියදම් ගුණකය

2 ස්වාධීන බදු ගුණකය

3 සංක්‍රාම ගුණකය හමුවේ

සාමාන්‍යයෙන් සංවෘත ආර්ථිකයක වියදම් ගුණකය පහත පරිදි දැක්විය හැකි ය.

$$K = \frac{1}{MPS}$$

රාජ්‍ය වියදම් වෙනස් වීම නිසා සමතුලිතයේ වෙනස්වීම → $\Delta y = K \times \Delta G$

- ස්වාධීන බදු ගුණකය

ස්වාධීන බද්දක් යම් වටිනාකමකින් වැඩි වන විට එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික නිමැවුම කොපමණ ප්‍රමාණයකින් අඩුවේදැයි බදු ගුණකයෙන් පෙන්වයි.

ස්වාධීන බදු සහ ජාතික නිමැවුම අතර පවතින්නේ ප්‍රතිලෝම සම්බන්ධතාවයකි.

$$Kt = \frac{-b}{1-b}$$

බද්දක් වෙනස් වීම නිසා සමතුලිතයේ වෙනස්වීම → $\Delta y = Kto \times \Delta T$

- සංක්‍රාම ගුණකය

$$Kr = \frac{b}{1-b}$$

සංක්‍රාම වෙනස් වීම නිසා සමතුලිතයේ වෙනස්වීම → $\Delta y = Kro \times \Delta r$

- විවෘත ආර්ථිකයේ වියදම් ගුණකය

$$K = \frac{1}{MPS}$$

ඕනෑම ආර්ථිකයක වියදම් ගුණකය එම ආර්ථිකයේ ගිලිහීම්වල පරස්පරයට සමාන වේ

නිදසුන (සියළු සංඛ්‍යා බිලියන වලිනි)

C = 200 + 0.75 yd

I = 400 G = 500

To = 100 X = 200 M= 300

1 සමතුලිත ජාතික ආදායම සොයන්න

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

2 වියදම් ගුණකය ගණනය කරන්න

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

3 ආයෝජනය 100 කින් වැඩිවුවහොත් නව සමතුලිතය

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

4 ස්වාධීන පරිභෝජනය 200 කින් වැඩි වුවහොත් නව සමතුලිතය

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

5 රාජ්‍ය වියදම් 200 කින් අඩුවුවහොත් නව සමතුලිතය

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

6 ස්වාධීන බදු 100 කින් වැඩිවුවහොත් නව සමතුලිතය

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

7 ආනයන 150 කින් වැඩිවුවහොත් නව සමතුලිතය

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

- තුලිත අයවැය ගුණකය

රජ්‍ය වියදම් ගුණකය සහ බදු ගුණකයේ වටිනාකම අතර වෙනස එකට සමාන වේ. එය තුලිත අයවැය ගුණකය ලෙස හදුන්වයි. රජයේ ආදායමට සමාන වියදමක් පවතින අයවැය ලේඛනයක් තුලිත අයවැය ගුණකය වටිනාකම එකට සමාන වේ.

තුලිත අයවැය ගුණකය = $K_G + K_T$

$$= \frac{1}{1-b} + \frac{-b}{1-b}$$

$$= \frac{1-b}{1-b}$$

$$= 1$$

එයින් අදහස් කරන්නේ රාජ්‍ය වියදම් සහ බදු සමාන ප්‍රමාණයකින් වැඩි කළ විට ජාතික ආදායම රාජ්‍ය වියදම් වැඩි කළ ප්‍රමාණයෙන් ම ප්‍රසාරණය වන බවයි. තුලිත අයවැය ලේඛනයක් ආර්ථිකයේ ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරයි.

මෙයට හේතු වන්නේ රජයේ වියදම් වැඩි කිරීම නිසා ඇති වන නිමවමේ ප්‍රසාරණාත්මක බලපෑම රජයේ බදු ආදායම ඉහළ දැමීමෙන් ඇති වන සංකෝචනාත්මක බලපෑමට වඩා ඉහළ අගයක් ගැනීමය.

නිදසුන ඃ-

$C = 200 + 0.8\,yd$

රාජ්‍ය වියදම සහ ස්වාධීන බදු මිලියන 100න් වැඩිකළ විට ආර්ථිකයෙ සමතුලිත ආදායම සොයමු

රාජ්‍ය වියදම් ගුණකය $= \dfrac{1}{1-b} = \dfrac{1}{1-0.8} = \dfrac{1}{0.2} = 5$

ස්වාධීන බදු ගුණකය $= \dfrac{-b}{1-b} = \dfrac{-0.8}{1-0.8} = \dfrac{-0.8}{0.2} = -4$

$$\Delta y = (Kg \times \Delta G) + (Kt \times \Delta T)$$


$$= (5 \times 100) + (-4 \times 100)$$

$$= (500) + (-400)$$

$$\Delta y = 100$$

- පූර්ණ සේවා නියුක්ති මට්ටමේ සමතුලිත නිමැවුම


කිසියම් ආර්ථිකයක විභව නිමැවුම නැතහොත් පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම පවත්වා ගැනීමට අවශ්‍ය සමාහාර ඉල්ලුම් මට්ටමක් පවතී නම් එය පූර්ණ සේවා නියුක්ති මට්ටමේ සමතුලිත නිමැවුම වශයෙන් හැඳින්වේ. මෙය පහත සඳහන් ප්‍රස්තාර සටහනෙන් ඇසුරෙන් පෙන්විය හැකි ය.




ප්‍රස්තාරයේ $Y_F$ නිමැවුම් මට්ටමෙන් පෙන්නුම් කරනුයේ පූර්ණ සේවා නියුක්ති මට්ටමේ සාර්ව ආර්ථික සමතුලිතයයි. එහි දී පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම ( $Y_F$ ) එය පවත්වා ගෙන යාමට අවශ්‍ය සමාහාර වියදමට ( $E_F$ ) සමාන වේ. මෙහිදී උද්ධමනාත්මක හෝ අවධමනාත්මක තත්ත්ව හෝ නොපවතී.

- උද්ධමනාත්මක පරතරය


ඇතැම් අවස්ථාවල දී පූර්ණ සේවා නියුක්ති මට්ටමේ නිමැවුමට අවශ්‍ය ඉල්ලුම ඉක්මවා සැබෑ සමාහාර ඉල්ලුම (වියදම) ඉහළ ගිය විට උද්ධමනාත්මක පරතරයක් ඇති වේ. එය පහත ප්‍රස්තාර සටහනෙන් පැහැදිලි කළ හැකි ය.




ප්‍රස්තාරයේ $Y_F$ යනු පූර්ණ සේවා නියුක්ති මට්ටම වන අතර $Y_2$ යනු ආර්ථිකයේ පවතින සාර්ව ආර්ථික සමතුලිත මට්ටම වේ. මෙහි $E_F$ වක්‍රයෙන් පෙන්නුම් කරනුයේ පූර්ණ සේවා නියුක්ති නිමවුමට අවශ්‍ය සමාහාර වියදම වන අතර $E_1$ වක්‍රයෙන් පෙන්නුම් කරනුයේ පූර්ණ සේවා නියුක්ති මට්ටමට අවශ්‍ය වියදම ඉක්මවා දැනට පවතින සැබෑ සමාහාර වියදම් තත්වයයි. මෙහි a - b පරතරය මගින් උද්ධමනාත්මක පරතරය පෙන්නුම් කරයි.

- ප්‍රතිගමනාත්මක (අවධමනාත්මක) පරතරය

ආර්ථිකයක ඇතැම් අවස්ථාවලදී පූර්ණ සේවා නියුක්ති නිමවුමට අවශ්‍ය සමාහාර වියදමට වඩා අඩු සැබෑ සමාහාර වියදමක් ආර්ථිකය තුළ පවතී. එය ආර්ථිකයක ඇතැම් අවස්ථාවලදී පූර්ණ සේවා නියුක්ති නිමවුමට අවශ්‍ය සමාහාර වියදමට වඩා අඩු සැබෑ සමාහාර වියදමක් ආර්ථිකය තුළ පවතී. එය ප්‍රතිගමනාත්මක (අවධමනාත්මක) පරතරයක් සහිත තත්ත්වයකි.



ඉහත ප්‍රස්තාරයට අනුව $Y_F$ පූර්ණ සේවා නියුක්ති සමතුලිත තත්ත්වය වන අතර $Y_2$ මගින් පෙන්නුම් කරනුයේ ආර්ථිකයේ පවතින සමතුලිත නිමවුම් මට්ටම වේ. $E_F$ වක්‍රයෙන් පෙන්නුම් කරනුයේ පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම අවශ්‍ය සමාහාර වියදම වන අතර $E_1$ වක්‍රයෙන් පෙන්නුම් කරනුයේ පූර්ණ සේවා නියුක්ති නිමවුම් මට්ටමට අවශ්‍ය වියදමට වඩා අඩු දනට ආර්ථිකයේ පවතින සැබෑ සමාහාර වියදම වේ. මෙහි a - b පරතරය මගින් පෙන්නුම් කරනුයේ අවධමනාත්මක පරතරයයි. මෙහි $Y_F - Y_2$ මගින් පෙන්වන්නේ ප්‍රතිගමනාත්මක පරතරය හෙවත් සේවා වියුක්ති පරතරයයි.

## ආදර්ශ ප්‍රශ්න

01 සමතුලිත ජාතික ආදායම් රේඛාව හරහා පරිභෝජන රේඛාව ගමන් කරන ස්ථානයේදී සාමාන්‍ය පරිභෝජන නැමියාව.

1. එකට අඩු අගයක් ගනී 2. එකට වැඩි අගයක් ගනී. 3. එකට සමාන වේ.
4. ශුන්‍ය වේ. 5. ඉහත කිසිවක් නොවේ.

02 . රටක පූර්ණ සේවා නියුක්ති ආදායම්, මට්ටමේදී උද්ධමන පරතරයක් ඇති වන්නේ,

1. සමාහාර සැපයුම ඉක්මවා සමාහාර ඉල්ලුම වැඩිවීමෙනි.
2. වැටුප් වැඩිවීම ඉක්මවා මිල වැඩිවීමෙනි.
3. සැලසුම්කළ ආයෝජන ඉක්මවා සැලසුම් කළ ඉතිරිකිරීම් වැඩි වීමෙනි.
4. ජාතික නිෂ්පාදිතය ඉක්මවා ජාතික ආදායම වැඩි වීමෙනි.
5. වැටුප් වැඩිවීම ඉක්මවා මිල වැඩිවීමෙනි.

03 . සරල ආර්ථිකයක ස්වාධීන පරිභේජනය ශුන්‍ය ලෙස සලකා සමාන්‍ය පරිභෝජන නැමියාව 0.8 යැයි ද, ආයෝජනය 2000 ක් යැයිද සිතන්න. මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම.

1. රු. 1000 කි. 2. රු. 8000 කි. 3. රු. 9000 කි. 4. රු. 10000 කි. 5. රු. 15000 කි.

04.සංවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 100 + 0.8Yd$ වේ. ස්වාධීන බදු 100 ක් හා රජයේ සංක්‍රාම වියදම 80 ක් රජය විසින් ක්‍රියාත්මක කළහොත් එම බලපෑම ගැළපුම් කළ පරිභෝජන ශ්‍රිතය නිවැරදිව දක්වෙන පිළිතුර කුමක්ද?

(1) $C = 84 + 0.8Y$ (2) $C = 84 + 0.8Yd$

(3) $C = 104 + 0.8Y$ (4) $C = 116 + 0.8Y$

(5) $C = 120 + 0.8Y$

05 ආර්ථිකයේ විභව නිමැවුම් මට්ටම පවත්වා ගැනීමට අවශ්‍ය සමාහාර ඉල්ලුම $E = 1000 + 0.8Y$ වේ. මෙම ආර්ථිකයේ සැබෑ සමාහාර ඉල්ලුම $E = 1200 + 0.8Y$ දක්වා වැඩි වුවහොත් ඇතිවන ප්‍රතිවිපාක වනුයේ,

(1) මූර්ත නිමැවුම ඉහළ ගොස් සේවා වියුක්ති පරතරයක් ඇති වීම.

(2) මූර්ත නිමැවුම පහළ ගොස් සේවා වියුක්ති පරතරයක් ඇති වීම.

(3) මූර්ත නිමැවුම ඉහළ ගොස් උද්ධමන පරතරයක් ඇති වීම.

(4) මූර්ත නිමැවුම ස්ථාවරව තිබියදී උද්ධමන පරතරයක් ඇති වීම.

(5) මූර්ත නිමැවුම ස්ථාවරව තිබියදී අවධමන පරතරයක් ඇති වීම.

06 ආවෘත ආර්ථිකයක් තුළට රජය මැදිහත්වීමෙන් පසු ආර්ථිකයේ සමතුලිතය දැක්වෙන නිවැරදි ප්‍රකාශය මින් කුමක්ද?

(1) $Y = C + I + G + x - m$ (2) $Y = C + I$ (3) $S = I$

(4) $y = C + I + G$ (5) $S + T + M = I + G + x$

07 කල්පිත ආර්ථිකයක ඉතුරුම් රු.මි. 2000 ක්, බදු රු.මි. 2400 ක්, ආනයන රු.මි. 1000 ක්, අපනයන රු.මි. 800 හා ආයෝජන රු.මි. 1600 ක් වූයේ නම් රජයේ මිල දී ගැනීම් කොපමණද?

(1) රු.මි. 1600 (2) රු.මි. 1500 (3) රු.මි. 3000

(4) රු.මි. 2000 (5) රු.මි. 3600

08 සාර්ව ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 200 + 0.8\,yd$ නම් මෙහි බදු ගුණකය වන්නේ,

(1) -4 (2) 4 (3) .66 (4) 2/3 (5) 0.4

## රචනා ප්‍රශ්න

01. එක්තරා ආර්ථිකයකට අදාළ සාර්ව අර්ථික දත්ත කීපයක් පහත දැක්වේ.

පරිභෝජන ශ්‍රිතය $= C = 100 + 0.8yd$

ආයෝජන ශ්‍රිතය $(I) = 240$

රජයේ පරිභෝජන වියදම් $(G) = 200$

බදු අයකිරීම $(T) = 160$

රජයේ සංක්‍රාම $(Tr) = 110$

අ) සමතුලිත ජාතික නිමැවුම සොයන්න. (ලකුණු 4)

ආ) මෙම ආර්ථිකයේ ආයෝජන 440 දක්වා වැඩි කළේ නම් සමතුලිත නිමැවුම කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේද? (ලකුණු 2)

ඇ) රජයේ වියදම් ගුණකය හා බදු ගුණකය ගණනය කරන්න. (ලකුණු 2)

02. පහත සඳහන් සමීකරණ වලින් පිළිබිඹු වන සාර්ව ආර්ථිකයක් සැලකිල්ලට ගන්න. (වටිනාකම රුපියල් මිලියන වලිනි.)

පරිභෝජන වියදම C = 200 + 0. 9yd          ආයෝජන වියදම I = 80

රජයේ වියදම G = 300          බදු T = 120

ඉහත සඳහන් තොරතුරු ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අ. සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න.

ආ. ආයෝජනය රුපියල් මිලියන 200කින් වැඩි වන්නේ නම් සමතුලිත ජාතික ආදායම් මට්ටමට කුමක් වේද?

ඇ. පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම මට්ටම රුපියල් මිලියන 5000ක් වේනම් එම මට්ටම ලඟා කර ගැනීම සඳහා ආයෝජනය කොතරම් ප්‍රමාණයකින් වැඩි කළ යුතුද?

(පැවති ජාතික ආදායම(අ) සඳහා ලැබුණු අගය සිතන්න.) (ලකුණු 3)

ඈ. එක්තරා සංවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය C= 200 + 0.9yd විය. එම ආර්ථිකයේ අයවැය මගින් දැනට පැවති රාජ්‍ය වියදම රු. මිලියන 100කින්ද ස්ථාවර බදු රු. මිලියන 100කින් ද වැඩිකරන ලදී. ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායමට වන බලපෑම දක්වන්න. (ලකුණු 4)

03 සමහර වියදම් ඇතුලත් සංරචක කවරේද?

03 1 සරල ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය c = 300 + 0.75 Y වේ.

(අ) ඉතුරුම් සමීකරණය ගොඩනගන්න.

(ආ) ආදායම රු. 2000 දී ඉතුරුම් මට්ටම ගණනය කරන්න.

(ඉ) ඉතුරුම් ශුන්‍ය වන ආදායම් මට්ටම කුමක්ද?

දයාබර දරුවනේ

බොහොම දුර ජීවිතේ

තුටින් පිය නගන්නට

ගිරිදඹක් ජීවිතේ

යෙහෙන් නිති තරණයට

අවැසි හා එකම මග

***A / L***

විශිෂ්ඨ ලෙස ජයගනිමින්

විශ්වයම

විජයග්‍රහණය කරන්නට

සෙනෙහසින් සුභපැතුම්

R H M S **කුමුදුනී රාජකරුණා**

**ර / විද්‍යාලෝක ම. ම. වි**

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."